# වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය
# ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

## 1. හැඳින්වීම

2011 අංක 05 දරණ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතෙහි I කොටසෙහි 2(1) අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව පිහිටුවා ඇති අතර, එහි 10 වන වගන්තිය අනුව සභාවේ කර්තව්‍ය ඉටුකිරීමේදී ඊට සහාය වීම සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත. එහිදී ගනු ලැබූ තීරණයක් අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු කාර්ය පරිපාටිය සැලකිල්ලට ගනිමින් වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය විසින් ස්ථාන මාරුවීම් සිදුකරනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු සෑම වර්ෂයකම ජනවාරි මස පළමුවන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ.

## 2. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

මෙම පරිපාටියේ නිලධාරීන් යන්නෙන්, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ I, II, III ශ්‍රේණියේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් යන සියළු දෙනාම අදහස් වේ. එසේම, නිලධාරියාගේ පත්වීම් දිනය යන්නෙන් අදහස් වනුයේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් III ශ්‍රේණියට පත්වූ දිනයයි.

## 3. සේවා ස්ථානයේ සේවා කාලය

I. සේවාවේ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලැබූ හා කිසියම් සේවා ස්ථානයක වසර 03 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන්ට ස්ථාන මාරු අයදුම් කළ හැක.

II. එකම සේවා ස්ථානයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරීන් ස්ථාන මාරුවලට යටත් වේ.

III. කිසියම් සේවා ස්ථානයක වසර 03 ට අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අයදුම්පත් ඉදිරිපත් කර ඇත්තේ නම්, එම අයදුම්පත් සලකා බැලීම පිළිබඳ අවසන් තීරණය සේවා අවශ්‍යතාවය මත සලකා බලනු ලැබේ.

## 4. ස්ථාන මාරු කමිටු සංයුතිය

| | | | |
|---|---|---|---|
| I. | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | - | සභාපති |
| II. | පරිපාලන නිලධාරී | - | සාමාජික |
| III. | වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්ගේ වෘත්තීය සමිතිය නියෝජනය කරමින් නියෝජිතයෙක් | - | සාමාජික |

## 5. ස්ථාන මාරු සමාලෝචන කමිටු සංයුතිය

I. අධ්‍යක්ෂ

II. සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)

III. අමාත්‍යාංශයට අනුයුක්ත ආයතනයක නියෝජිතයෙකු

## 6. පොදු කරුණු

I. භාර්යාව හා ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු නම් ස්ථාන මාරු ඉල්ලීම අනුව ස්ථාන මාරු කිරීමේදී දෙදෙනාටම එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට ස්ථාන මාරු කමිටුව හැකිතාක් උත්සාහ කළ යුතුය.

II. වයස අවුරුදු 53 ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථානමාරු කළ නොහැකි වුවද, දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කිරීම් සිදුකළ යුතුය.

III. ආබාධ සහිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එකතැන්ව සිටින කලත්‍රයන් හා නිලධාරීන්ගේ වයෝවෘද්ධ රෝගී මවුපියන් වැනි පාලනයෙන් බැහැර මානුෂීය හේතු සැලකිල්ලට ගත හැකිය.

IV. වාර්ෂික ස්ථාන මාරු ගණනය කරනු ලබනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනටය.

V. ස්ථාන මාරු ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේ දී සලකා බලනු ලබන්නේ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පමණි.

VI. සෑම නිලධාරියෙකුගේ පළමු කැමැත්ත සහිත සේවා ස්ථානයට ස්ථාන මාරුවීම් ලබාදීමට හැකි සෑම උත්සාහයක්ම දරනු ලැබේ. පළමු කැමැත්ත නොලැබූ නිලධාරියෙකුගේ දෙවන කැමැත්ත පළමු කැමැත්ත ලෙස සලකා ඒ අනුව ස්ථාන මාරුවීම් ලබාදීමට උත්සාහ දරනු ලැබේ. දෙවන කැමැත්ත සහිත සේවා ස්ථානයට ද ස්ථාන මාරුවීම ලබාදීමට නොහැකිවන නිලධාරීන්ගේ තුන්වන කැමැත්ත පළමු කැමැත්ත ලෙස සලකනු ලැබේ.

## 7. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන

| | | | |
|---|---|---|---|
| I. | ජුනි මස 30 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳව දැන්වීම් නිකුත් කිරීම |
| II. | ජූලි මස 31 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අධ්‍යක්ෂ වෙත භාරදීම |
| III. | අගෝස්තු මස 10 දිනට පෙර | - | අධ්‍යක්ෂ වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුව වෙත භාරදීම |
| IV. | අගෝස්තු මස 31 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අධ්‍යක්ෂ වෙත ලිඛිතව භාරදීම |
| V. | සැප්තැම්බර් මස 15 දිනට පෙර | - | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම |
| VI. | සැප්තැම්බර් මස 30 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව (අභියාචනා මණ්ඩල) පත් කිරීම |
| VII. | ඔක්තෝබර් මස 15 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා විමර්ශනය කිරීම සිදු කිරීම |
| VIII. | නොවැම්බර් මස 01 දිනට පෙර | - | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම |
| IX. | එළඹෙන වසරේ ජනවාරි මස 01 | - | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක වේ |

**8. සැලකිය යුතු විශේෂිත කරුණු**

I. වෘත්තීය සංගමයක නිලධාරීන්ව ස්ථාන මාරු කිරීමේදී ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ සහ එම අනුශාංග චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කිරීම කළ යුතුය.

II. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත (අභියාචනා තීරණයෙන් පසු) පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කළ පසු නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධාරියෙකු ස්වකීය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකනු ලැබේ.

III. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට අනුව නිලධාරියෙකු නව සේවා ස්ථානයට පැමිණීමට පෙර වහාම ඔහු භාරයේ ඇති රාජකාරී ලිපි ගොණු, ලිපි ලේඛන, රජය සතු අනෙකුත් දේපළ යතුරු, පරිගනක මුරපද හා රාජකාරි හැඳුනුම්පත ආදිය ස්ථාන මාරු නියෝගයන් ක්‍රියාත්මක වන දිනට ප්‍රමාණවත් සාධාරණ කාලයකට පෙර යථා පරිදි භාර දිය යුතුය.

IV. සේවා අවශ්‍යතාවය මත, විනය කරුණු මත හෝ පරිපාලන කරුණු මත වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙන් බැහැරව ඕනෑම නිලධාරියෙකු වෙත ස්ථාන මාරු ලබාදීමට හැකිය.

V. IV කරුණ මත හැර වාර්ෂික ස්ථානමාරු අයදුම්පත් කැඳවීමෙන් පසු වෙනත් කිසිඳු ස්ථානමාරු සිදුකිරීමක් නොකළ යුතුය.

**9. ස්ථාන මාරු තීරණවලට එරෙහිව ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත යොමුකරන අභියාචනා සම්බන්ධ කාර්ය පරිපාටිය**

I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 50(1) ව්‍යවස්ථාව ප්‍රකාරව වාර්ෂික ස්ථාන මාරු කිරීමේ නියමයකින් අතෘප්තියට පත් වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරියෙකුට එම නියමයන්ට එරෙහිව ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එම අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අංක 23 පරිශිෂ්ඨය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු අතර, ඒ සමඟ තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලිපිවල සහතික කළ ඡායා පිටපත් ද ඉදිරිපත් කළ යුතුය.

II. වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරියෙකු විසින් ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත ස්ථාන මාරු තීරණයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ මඟින් වන අතර, එම අභියාචනයේ පිටපතක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වෙතද යොමු කළ යුතු වන්නේය. තමන් වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා අප්‍රමාදව තම නිරීක්ෂණ සහිතව ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත යොමු කිරීම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ වගකීමයි. නිලධාරියාට තම කැමැත්ත පරිදි අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුමව ස්ථාන මාරු සමාලෝචන කමිටුවට ඉදිරිපත් කළ හැක්කේය.

III. ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් කරනු ලැබූ වාර්ෂික ස්ථාන මාරු නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියමය අදාළ නිලධාරියා වෙත ලද දින සිට දින 14 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වන්නේය. එම නියමිත කාලයට ඉදිරිපත් නොවූ අභියාචනා ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

IV. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත යොමු කිරීම සඳහා නිලධාරියෙකු විසින් භාරදෙනු ලබන අභියාචනයන්ට අදාල සියළුම ලිපි ගොණු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද ඊට අදාළ තම නිරීක්ෂණ නිර්දේශ සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුලත ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ විසින් වගබලා ගත යුතු වන්නේය.

සෑම නිලධාරියෙකුම ඉහත සඳහන් කළ නියමයන්ට අනුව නව ස්ථාන මාරු පිළිබඳ අභියාචනා ඉදිරිපත් කළ යුතු අතර, එම නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනා ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් සලකා බලනු නොලබයි.

ඉහත නියමයන්ට අනුව, ස්ථාන මාරු කිරීමේ නියමයකට එරෙහිව නිලධාරියෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් එම අභියාචන නියෝගය ප්‍රසිද්ධ කළ දින සිට දින 14 ක් ඇතුලත තීරණයක් ලබාදෙනු ලබයි.

මෙවැනි අභියාචනයක් සම්බන්ධයෙන් වන ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ තීරණය අභියාචක වෙත සෘජුවම දන්වනු ලබන අතර, එහි පිටපතක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වෙත යැවිය යුත්තේය.

ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන නිලධාරියෙකුට වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇති අතර, එසේ ඉදිරිපත් කළද ඊට යටත්ව අදාළ දිනට ස්ථාන මාරු කිරීම ක්‍රියාත්මක වේ.

ස්ථාන මාරු නියෝග ප්‍රසිද්ධ කරනු ලබන්නේ ආයතන වෙබ් අඩවියේ වේ.

ඉහත සඳහන් සියළු කරුණු වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ නියෝග පරිදි වේ.

අධ්‍යක්ෂ
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය